# මහායානයේ සම්භවය දීර්ඝකාලීන මතවාදී ගැටුම්වල අවසාන ඵලයක් ද?

## මාවඩවිල ධම්මරතන හිමි

ආදි යුගයේ ශීලය යටතේ ඉතා සරලවූත් ලිහිල් වූත් ජීවන ප්‍රවෘත්තියක් භික්ෂු සංස්ථාව සතුවිය. තම ආචාර ශික්ෂණයෙහිලා භික්ෂූන් ප්‍රමාණත්වයෙන් ගෙන ඇත්තේ බුද්ධ දේශිත ධර්මයයි. විනය ප්‍රඥප්ති නොවේ. "ඛන්ති පරමං තපොතිතික්ඛා" යනාදී ගාථාවෙන් ද පෙනෙන්නේ විනය ප්‍රඥප්ති ස්වරූපයක් නොව ඕවාද උදෙසීමකි. නැතහොත් අනුශාසනාත්මක සිහි ගැන්වීමකි. ආර්‍ය මාර්ගයට අවශ්‍ය ශික්ෂණය ධර්මයෙහි ම අන්තර්ගත හෙයින් අමුතුවෙන් විනය ප්‍රඥප්ති අවශ්‍ය නොවීය. අවුරුදු විස්සක් පමණ කෙටි කාලයක් ශීලය මත සකස් වුණු භික්ෂු ශික්ෂණය ශීලය සඳහා ප්‍රමාණවත් නොවීමත් ඒ සඳහා ශික්ෂාපද ප්‍රඥප්තියක් අවශ්‍ය වීමත් විමසිය යුතු කරුණකි.

භද්දාලිය සූත්‍රය සංඝ සංස්ථාවේ ශික්ෂාපද බහුලව පැවැති යුගයක් කෙරෙහි අපගේ අවධානය යොමු කරවයි. බුදුහු ශික්ෂාපද බහුලත්වයට හේතු වශයෙන් දක්වා ඇත්තේ "සත්තෙසු හායමානෙසු සද්ධම්මෙ අන්තරධාය මානෙ" යනුවෙනි. සද්ධර්මය අතුරුදහන්වීම ශික්ෂාපද විපුලත්වයට හේතුව ලෙස මෙහි සඳහන් වේ. නිර්වාණගාමිත්වයට ප්‍රතිපක්ෂ ධර්මයන්හි භික්ෂූන් උත්සුක වන කල්හි යළි ඔවුහු විමුක්ති මාර්ගයට නතු කරවීම සඳහා කිසියම් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට ශාස්තෘන් වහන්සේට සිදුවිය. එහි ප්‍රතිඵලය වූකලී ශික්ෂා ප්‍රඥප්ති-යයි.

සංඝ සංස්ථාව සඳහා ශික්ෂාපද පැණවීමේදී බුදුන්-වහන්සේ බෙහෙවින්ම ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ අනුගමනය කර ඇති බව ප්‍රකට කරුණකි. නීතියක් පැණවීමට තරම් හේතුවක් උද්ගත නොවී තිබියදී පැණවුණු නීතියක් විනය පිටකයෙහිම අදෘශ්‍යමානය. නීති පද්ධතියක් තුළ භික්ෂු ජීවිතය හිරකොට තැබීමට උන්වහන්සේ කිසිවිට-කත් අපේක්ෂා නො කළහ. ප්‍රජාතාන්ත්‍රික නීති ප්‍රඥප්ති යෙහි එය ප්‍රධාන සිද්ධාන්තයෙකි. ශාරිපුත්‍ර ස්ථවිරයන් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම මෙහිලා සඳහන් කිරීම යුක්ති යුක්තය.

කාලය ශාසන කෙරෙහි බලපා ඇති බව "සංඝො රත්තඤ්ඤූ මහන්තං පත්තො හොති" යන්න මෙහිදී අපට පැහැදිලිය. බුද්ධ ධර්මය ආරම්භයට වඩා කල්ගත-වීමත් සමගම සාමාජික, ආර්ථික හා සාමයික ආදී කරුණු විමසීමේදී විපරිණාමයක් ඇතිවීම ස්වාභාවිකය. ශාසනික පරමාර්ථයෙන් ඈත්වුණු එක් පුද්ගලයෙකුගේ අනාචාර ශීලිත්වය අනුගමනය කළ බොහෝ භික්ෂූහු වූහ. ඡබ්-බග්ගිය හා සත්තරසවග්ගිය භික්ෂු සමූහයා විනය ශික්ෂාපද පැනවීමට කෙතරම් ඉවහල් වී ද? ලෞකික සෘද්ධියෙන් දෙවුදතුන් භික්ෂු භික්ෂුණීන් පමණක් නොව අජාසත් වැනි ප්‍රබල රජවරුන් පවා තම වසඟයට ගැනීමට සමත් විය. බුදුන්වහන්සේ ඉදිරිපිටදීම උන්-වහන්සේගේ නායකත්වය පවා නොපිළිගත් අත්ත-නෝමතිකව ක්‍රියා කළ සැහෙන භික්ෂු පිරිසක් වූ බව විනය පිටකයෙන් පෙනේ. දේවදත්ත කෝකාලිකත් සමග ගෙන ගිය අර්බුදය බුදුරදුන්ට අභියෝගයක් විය. භික්ෂුත්වයේ යථාර්ථය අමතක වී ලාභ කීර්ති ප්‍රශංසාදී ලෞකික අගයන් සෙවූ දේවදත්ත වැනි භික්ෂූහු නොයෙක් කුටෝපක්‍රමයන් අනුගමනය කරමින් භික්ෂූන් භේද බින්න කරවන තරම් මතවාදී අදහස් බුදු දහමට ඇතුළත් කිරීමට යත්න දැරූ බවට ත්‍රිපිටකයෙන් හා බෞද්ධ ඉතිහාසයෙන් ලැබෙන සාධක බොහෝය. මෙහි ලා පඤ්චවරය තත්කාලීන වෛදික සමාජයේ තදින්ම මුල් බැස ගත්තක් විය. මාංශ භක්ෂණයෙන් වැළකීම මහාසංඝිකයන් විසින් ද ඉහළින් පිළිගත් බවට ලඞ්කාවතාර සූත්‍රයේ මාංශ භක්ෂ පරිවර්ත නමින් සඳහන් කර ඇති බව පෙනේ.

බුදුන්වහන්සේට පමණක් නොව අග්‍රශ්‍රාවක දෙනමට පවා චෝදනා එල්ල වී තිබුණු බව ත්‍රිපිටකාගත කරුණු අනුව දක්නට පිළිවන. අගසව් තනතුරු ප්‍රදානය කිරීමේ දී අඤ්ඤාකොණ්ඩඤ්ඤ ආදී වෘද්ධයන් සිටියදී නවකයන්ට තනතුරු දීම අගතිගාමී ක්‍රියාවක් ලෙස දක්වා ඇත. ආරාම ආරවුලකදී එය විසඳීමට ඉදිරිපත් වූ අගසව් දෙදෙනා වහන්සේට "පාපිච්ඡා මොග්ගල්ලාන සාරිපුත්තා" ආදී වශයෙන් චෝදනා කිරීමට තරම් අස්සජී පුනබ්බසුක භික්ෂූන් දෙදෙන ප්‍රබල තත්ත්වයක සිටියහ.

කොසඹෑ නුවර ධර්මධර හා විනයධර භික්ෂූන්ගේ කලහය ගිහි සමාජයේ පවා සංක්ෂෝභයට ප්‍රබල හේතුවක් විය. බුදු දහම ධර්ම විනය යනුවෙන් විභජනය කොට අධ්‍යයන කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශාසනයෙහි නානාවිධ මතවාදී ගැටුම්වලට මූලික හේතුවක් වූවාට කිසිදු සැකයක් නැත. ධම්මධර, විනයධර ගැටුම් සියුම්ව විචාරක්ෂියට යොමු කිරීමෙන් මෙය පැහැදිලි වේ යැයි සිතිය හැකිය. භික්ෂු පිරිස බහුශ්‍රැතත්වයෙන් විපුලත්වයට පත්වීම නොහොත් එයින් මත්වීම ශාසනයේ අර්බුදකාරී ධර්මයන් පහළ කිරීමේ ප්‍රබල හේතුවකි.

ලාභ සත්කාර සම්මානාදියෙන් භික්ෂූන් අග්‍රප්‍රාප්ත වීම හා සසුනෙහි ආසවට්ඨනීය ධර්මයන් පහළ වීම තවත් කරුණක් විය. බ්‍රහ්මචර්‍යාව දුක් කෙළවර කිරීම පිණිස නොව පහසුවෙන් ජීවත්වීමේ එක්තරා ජීවනෝපායක් ලෙසට පත් කරගන්නට මානබැලූහු අධික වූහ. ලෞකිකත්වයට නම්‍ය වූ චිත්තය විරාගයට යොමු කිරීම අතිශයින්ම දුෂ්කර වූවකි. මෝක්ෂ මාර්ගයට භික්ෂූන් නතු කරලීම සඳහා බුදුරදුහු උත්සුක වූ බව "දාරුණො භික්ඛවෙ ලාභසක්කාර සිලොකො කටුකො ඵරුසො"......... යනාදී සූත්‍රයන්ගෙන් දිස්වේ. අරිට්ඨ සහ සාති යන භික්ෂුහු භික්ෂූන් අතර මතවාදී අදහස් දැරූ අය වූහ.

බුද්ධකාලීන නානාවිධ මතවාදී ගැටුම් භික්ෂූන් අතර තිබුණ ද බුදුන් වහන්සේගේ දූරදර්ශී ඥානයත් සථානෝචිත ප්‍රඥවත් නිසා ඒවා යටපත්ව පැවතිණ. උන්වහන්සේගේ පිරිනිවීමේ ආරංචිය ලැබුණු ක්ෂණයෙහි හඬන වැළපෙන භික්ෂූන් උදෙසා කරන ලද "ඇවැත්නි නොහඬවු, නොවැළපෙවු, ශෝක නොකරවු, මෙය කැපය; ඇකපයයි අප වෙහෙස වූ ඒ මහා ශ්‍රමණයාගෙන් අපි මිදුනො වම්හ. දැන් අපිට කැමැත්තක් කරමු. අකමැත්තක් නොකරමු"යි යන ප්‍රකාශය ඒ වන විට අත්තනෝමතිකව ක්‍රියා කිරීමට මාන බැලූ විශාල පිරිසක් සිටි බවට සාධකයෙකි. ඒ ප්‍රබල පිරිසකගේ නියෝජිතයා සුභද්‍ර විය හැකියි.

බොහෝ විචාරකයෝ නිකාය භේද හෙවත් භික්ෂු සංස්ථාවේ දෙදරීම දෙවන සංගීතියෙන් පසු ඇති වූ බව පවසතත් එහි මූල බීජයන් බුදුන් ධරමාන කාලයේදීම වූහයි ඉහත සඳහන් කරුණු විමසීමේ දී මනාව පැහැදිලි වන්නකි. දෙවන සංගායනාවෙන් බෙදී ගිය ප්‍රධාන කොටස් දෙක වූ ථෙරවාද හා මහාසංඝක යන කොටස් දෙකින් මහාසාංඝකයන් ඉදිරිපත් කළ කරුණු මහායානයට බෙහෙවින් ඉවහල් වූ බව පෙනේ.

බුදුරදුන් ජීවමාන කාලයේදීම ඇති වූ මහායාන බීජය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී ශාඛා ප්‍රශාඛාවන්ට බෙදී මල්ඵල හටගැනීම කණිෂ්ක යුගයේදී වූහයි සඳහන් කිරීම සාවද්‍ය නොවේ. මේ කරුණු සලකා බැලීමේදී මහායානයේ සම්භවය දීර්ඝකාලීනව පැවැති මතවාදී ගැටුම්වල අවසාන ඵලයයි පැවසීම යුක්ති යුක්තය.

**වාසිය දුටුව විටකදි යුතුකම මැරුව**
**ලෝකය දැනෙයි මට නම් හරි බියකරුව**
**මා පිය සොයුර, මා පිය සිංහල දරුව**
**කාලය ගෙවිය යුතුවෙයි නුවණට හුරුව**

**(අඥාත කවියෙක්)**